## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මණ්ඩලයේ ශ්‍රී ලංකා සංචාරය නිමා වේ

2015 සැප්තැම්බර් මස 18 වැනි දින

රටක සංචාරයක් අවසන් කිරීමෙන් පසු නිකුත් කරනු ලබන පුවත්පත් නිවේදනයන්හි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) දූත මණ්ඩලයේ මූලික නිරීක්ෂණයන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශයේ ඇති අදහස් ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායමේ මතය වන අතර එමගින් අවශ්‍යයෙන්ම ජා.මූ. අරමුදලේ කළමනාකාරිත්වයේ හෝ විධායක මණ්ඩලයේ මතය පිළිබිඹු නොකෙරෙයි. දූත මණ්ඩලයේ මූලික නිරීක්ෂණ පදනම් කොට ජා.මූ. අරමුදල වාර්තාවක් පිළියෙල කරන අතර කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව එය ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡා කිරීමටත්, තීරණ ගැනීම සඳහාත් ඉදිරිපත් කෙරෙයි.

ටොඩ් ෂ්නයිඩර් (Todd Schneider) මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ජා.මූ. අරමුදලේ දූත පිරිසක් සැප්තැම්බර් මස 8 වැනි දින සිට 18 වැනි දින දක්වා කාලය තුළ දී පසු වැඩසටහන් අධීක්ෂණ (Post-Program Monitoring) සාකච්ඡා සඳහා කොළඹට පැමිණියේය. මෙම අධීක්ෂණය, ජා.මූ. අරමුදලේ සම්පත්වලට "විශේෂිත ප්‍රවේශය" යටතේ අවස්ථාව ලද රටවල් සඳහා පොදු ක්‍රියාමාර්ගයක් වන අතර, එය 2012 වසරේ දී ජා.මූ. අරමුදලේ එ.ජ. ඩොලර් බිලියන 2.6 ක ණය පහසුකම සාර්ථකව අවසන් කළ ශ්‍රී ලංකාව සඳහා ද අදාළ වේ. එම දූත පිරිස, අග්‍රාමාත්‍යවරයා, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් මෙන්ම සිවිල් සමාජයේ සහ ව්‍යාපාරික ප්‍රජාවේ නියෝජිතයන් සමඟ ද සාකච්ඡා පවත්වන ලදී.

මෙම සංචාරය අවසානයේ දී ෂ්නයිඩර් මහතා විසින් පහත සඳහන් ප්‍රකාශය නිකුත් කරන ලදී.

"සේවා අංශයේ ඉහළ වර්ධනය හා කෘෂිකාර්මික අංශය නැවත යථා තත්ත්වයට පත්වීම තුළින් 2015 වර්ෂයේ පළමු භාගයේ දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ දත්ත මගින් ආර්ථිකයේ වර්ධනයක් පෙන්නුම් කරන අතර 2015 වසර අවසානය වන විට මෙම වර්ධනය සියයට 5 - 5.5 අතර පරාසයක අඛණ්ඩව පැවතිය හැකිය. රාජ්‍ය අංශයේ වැටුප් හා වේතන සැලකිය යුතු මට්ටමකින් ඉහළ යෑම තුළින් වර්ධනය වූ පාරිභෝගික වියදම්, පාරිභෝගික හා අනෙකුත් භාණ්ඩවල ඉහළ ආනයන වර්ධනයට දායක වූ අතර, එය තෙල් මිල ගණන් පහළ යෑමෙන් ලැබූ ඉතුරුම්වලට වඩා ඉහළ අගයක් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය (ඉන්ධන හැර) ඉහළ යෑම

වසරේ පළමු මාස අට තුළ මහ බැංකුවේ විදේශ සංචිත අඛණ්ඩව අඩු වීම සඳහා දායක වී ඇත. මතුපිට උද්ධමනය දැනට ශුන්‍යයට ආසන්න මට්ටමක පැවතිය ද වසර අවසානයේ දී එය සියයට 3 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. දේශීය වෙළෙඳ නොවන ද්‍රව්‍ය සඳහා වූ ඉහළ ඉල්ලුම හා ආර්ථික කටයුතු සඳහා සම්පත් භාවිතය ක්‍රමයෙන් ඉහළ යෑම හේතුවෙන් වසර ආරම්භයේ සිට මූලික උද්ධමනය අඛණ්ඩව ඉහළ ගොස් තිබේ. අමෙරිකා එක්සත් ජනපදයේ අපේක්ෂිත දැඩි මුදල් ප්‍රතිපත්තිය සහ නැගී එන වෙළෙඳපොළවල වර්ධන අපේක්ෂාවන්ගේ අවිනිශ්චිතභාවය හේතුවෙන් විදේශීය මූල්‍යනය වඩාත් විචලනය වනු ඇති අතර එම නිසා ඉදිරි දැක්මට යම් අවදානමක් ඇති විය හැකිය.

"ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල සඳහා දෛනිකව එතැන් මිලක් (Spot Prices) නියම කිරීම අත්හිටුවමින් විනිමය අනුපාතය තීරණය වීමේ දී වෙළෙඳපොළ බලවේගවලට පුළුල් කාර්යභාරයක් ඉටු කිරීමට ඉඩ හැරීම සඳහා මෑතක දී ගනු ලැබූ තීරණය දූත පිරිසේ ඇගයීමට ලක් වේ. මින් ඉදිරියට, තරගකාරිත්වය පවත්වාගෙන යෑම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය සංචිත වර්ධනය කර ගැනීමට පහසුකම් සැලසීම පිණිස විනිමය අනුපාතයේ නම්‍යශීලීභාවය පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව කැප විය යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළ පුළුල් කිරීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග සහ ආයෝජන ලැබීම් ශක්තිමත් කිරීම සඳහා විදේශ විනිමය පාලන රෙගුලාසි සමාලෝචනය සඳහා කටයුතු කිරීම දූත පිරිසේ පැසසුමට ලක් වේ. මීට අමතරව, සමස්ත මූල්‍ය පද්ධතිය ස්ථාවර බවත්, වත්මන් මුදල් ප්‍රතිපත්තිය යෝග්‍ය බවත් දූත පිරිසෙහි අදහස වන නමුත්, ඉහළ යන මූලික උද්ධමනය, පෞද්ගලික අංශයෙහි ණය ප්‍රමාණය යළි ඉහළ යෑම සහ ආර්ථික කටයුතු සඳහා සම්පත් භාවිතය ක්‍රමයෙන් ඉහළ යෑම යන කරුණු හමුවේ සුපරීක්ෂාකාරී විය යුතු බව නිර්දේශ කෙරේ. මෙම තත්ත්වය යටතේ, දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් කෙරෙහි යොමු වීම යෝග්‍ය වනු ඇත.

"රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීමට සහ රාජ්‍ය ණය අඩු කිරීමට ඉතා ඉක්මනින් සුදුසු පියවර ගත යුතු බවට බලධාරීන් දරන මතය සමඟ දූත මණ්ඩලය එකඟ වේ. දූත මණ්ඩලය විසින් 2015 වසරේ දී අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.5 ත් 6 ත් අතර වනු ඇතැයි පුරෝකථනය කර ඇත. අයවැය හිඟය ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා වැඩි අගයක් වන අතර, එය මූලිකවම මූල්‍යනය කෙරෙනුයේ දේශීය ණය ගැනීම් තුළිනි. ඉදිරි කාලය දෙස අවධානය යොමු කිරීමේ දී, 2016 වසර සඳහා වන අයවැය, මැදි කාලීන තිරසාර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් වෙත යොමු වූ මාවතකට නැවත ප්‍රවේශ වීමට සහ 2016 සහ ඉන් ඔබ්බට සාර්ව ආර්ථික ප්‍රමුඛතාවයන් තීරණය කිරීමට ලැබෙන මහඟු අවස්ථාවකි. දූත පිරිස, 2016 වසර සඳහා වන අයවැයෙහි හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.5 මට්ටමේ පවත්වාගත යුතු බවත්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීම, වියදම් පාලනය සහ කල්පවත්නා බදු ප්‍රතිසංස්කරණ යනාදියේ සංකලනයක් මත පදනම් කර ගත යුතු බවට අවධාරණය කරනු ලැබීය. බදු ක්‍රමය සරල, සාධාරණ සහ කාර්යක්ෂමම කර ගැනීමේ ක්‍රමවේදයක් සකසා ගැනීම

සඳහා බදු වියදම් (බදු නිදහස් කිරීම්, බදු විරාම සහ බදු අනුපාත අඩුකිරීම්) අවම කිරීමේ අවශ්‍යතාවය දූත මණ්ඩලය විසින් අවධාරණය කරන ලදී.

"වෙළෙඳපොළ මත පදනම් වූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය පිළිබඳව බලධාරීන් දක්වන අවධානය සහ මූලික ක්‍රියාමාර්ගයන් ශක්තිමත් කිරීම සඳහා ඔවුන් දරන උත්සාහය දූත මණ්ඩලයෙහි ඇගයීමට ලක් වේ. ඉන්ධන සහ විදුලිය මිලකරණය, සහනාධාර, වෙළෙඳ ප්‍රතිපත්තිය, සාධක (විශේෂයෙන්ම ඉඩම්) වෙළෙඳපොළ ලිහිල්කරණය සහ ආයෝජන පරිසරය ආදිය ආර්ථික වර්ධන වේගය ඉහළ මට්ටමක පවත්වා ගැනීමෙහිලා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි අංශයන් වේ. රාජ්‍ය ව්‍යාපාර වාණිජමය අඩිතාලමක පිහිටුවීම, වෙළෙඳපොළ පදනම් කරගත් මූල්‍ය තීරණ (මිලකරණය ඇතුළුව) ගැනීම සඳහා ඔවුන්ට ඉඩප්‍රස්ථාව සැලසීම සහ වඩා ඉහළ මූල්‍ය ශික්ෂණයක් රාජ්‍ය ව්‍යාපාරවල ද පවත්වා ගැනීම සඳහා දිරිගැන්වීම ද අයවැය සහ මූල්‍ය පද්ධතිය කෙරෙහි ඇති අවදානම අඩු කිරීමට උපකාරී වනු ඇත.

"පසු වැඩසටහන් අධීක්ෂණය සම්බන්ධව ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡාවක් 2015 නොවැම්බර් මැද භාගයේ දී පැවැත්වීමට අපේක්ෂිතය."